# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2400/40 - 2024 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත**

2013 අංක 20 දරන පනතින් අවසන් වරට සංශෝධිත 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 8 වැනි වගන්තිය යටතේ බදු අභියාචනා කොමිෂන් සභාව මගින් සාදනු ලබන රීති.

විනිසුරු **පී. ඩබ්ලිව්. ඩී. සී. ජයතිලක**,
සභාපති,
බදු අභියාචනා කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් 04 වැනි දින,
කොළඹ දී ය.

රීති (සංශෝධන)

2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 8 වැනි වගන්තිය යටතේ බදු අභියාචනා කොමිෂන් සභාව මගින් සාදනු ලැබ, 2012 මැයි 28 දිනැති අංක 1760/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කළ රීති පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ:

1. 12 වැනි රීතියේ (2) වන අනුරීතියට ඉක්බිතිවම පහත දැක්වෙන අනුරීතින් ඇතුලත් කිරීමෙන්:

"(3) අභියාචක විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පෙත්සමෙහි අභියාචනය සඳහා පදනම් වන සියලුම නිශ්චිත ගැටලු පැහැදිලිව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) අභියාචක සහ වගඋත්තරකරු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලබන ලිඛිත දේශන මගින් ස්වකීය කෘත්‍යය කොමිෂන් සභාව ඉදිරියේ සාධනය කිරීම සඳහා ඔවුන් විශ්වාසය තබන කාරණා පැහැදිලිව සහ නිශ්චිතව දැක්විය යුතු ය.

(5) සිය අභියාචනය සනාථ කිරීම සඳහා අභියාචක යම් ලේඛනයක් කෙරෙහි විශ්වාසය තබන අවස්ථාවකදී, එවැනි ලේඛනයන්හි සහතික පිටපත් අභියාචනා පෙත්සම සමග ඉදිරිපත් කළ යුතු ය.

(6) අභියාචනය විභාග කරනු ලබන අවස්ථාවේ දී -

(අ) අභියාචනා පෙත්සම මගින් නිශ්චිතව දක්වා නොමැති හෝ අනාවරණය කර නොමැති කිසිදු කාරණයක් හෝ කාරණා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙතින් පළමුව අවසරය ලබාගෙන ඇත්නම් මිස, අභියාචක වෙත අවසර ලබා නොදිය යුතු ය;

(ආ) තීන්දුවක් හෝ පරිපාලන සමාලෝචන තීරණය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිද්දෙන් රුකුලක් විය හැකි අභියාචනයේ හෝ වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව ඉදිරියේ ගොනුකළ ලිඛිත දේශනවල විෂය මූලික වන කාරණය අවස්ථාවෝචිත පරිදි තීන්දුවේ දී හෝ දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ පරිපාලන සමාලෝචන තීරණයේ දී හෝ අනාවරණය නොකරන ලද්දේ නම් එකී කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු වෙත අවසර ලබානොදිය යුතු යඃ

එසේ වුව ද, එවැනි තීරණයකදී හෝ එවැනි පරිපාලන සමාලෝචනයක දී හෝ ලිඛිත දේශනවල දී එකී කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූයේ ඇයිද යන්න සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් දක්වා ඇති හේතු පිළිබඳව කොමිෂන් සභාව සෑහීමකට පත්වේ නම්, එකී කරුණු කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසර ලබාදිය හැකි ය;

සහ

(ඇ) අභියාචක හෝ වගඋත්තරකරු වෙනුවෙන් අවස්ථාවෝචිත පරිදි අභියාචකගේ හෝ වගඋත්තරකරුගේ එක් නියෝජිතයෙකුට පමණක් නියමිත සැසිවාරයක දී කොමිෂන් සභාව ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමට අවසර හිමි වන අතර එවැනි අවස්ථාවක දී එකී නියෝජිතවරයා විසින් පමණක් දිනය සඳහා වන ඔහුගේ හෝ ඇයගේ කරුණු සැලකිරීම් අවසන් කළ යුතු ය.

(7) අභියාචනය කැඳවනු ලබන අවස්ථාවේ දී අභියාචක විසින් ඒ සඳහා ඉල්ලීමක් කර තිබේ නම්, වගඋත්තරකරු විසින් ගොනු කරනු ලබන ලිඛිත දේශන සඳහා ප්‍රතිචාර වශයෙන් ප්‍රති ලිඛිත දේශන ගොනු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අභියාචක වෙත අවසර ලබාදිය හැකි යඃ

එසේ වුව ද, වගඋත්තරකරු විසින් ඔහුගේ ලිඛිත දේශනවලදී ඉදිරිපත් කරනු ලබන යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් ඊට එදිරිව යම්කිසි ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන ඇත්තේ නම් මිස, අභියාචනය විභාග කරන අවස්ථාවේ දී හෝ ඉන් අනතුරුව අභියාචක වෙත අවසර ලබා නොදිය යුතු ය.

(8) කොමිෂන් සභාව විසින් අභියාචක විසින් ඉදිරිපත් කළ අභියාචනය සම්බන්ධයෙන් සිය තීරණය ප්‍රකාශයට පත්කිරීමේ දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට අනෙක් සාමාජිකයන් දෙදෙනාගේ අදහසට වෙනස් අදහසක් එකී තීරණය සඳහා පාදක වූ යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් පවතී නම්, එකී සාමාජිකයා විසින් එම අදහස එකඟ නොවූ තීරණයක් ලෙස ප්‍රකාශ කළ යුතු ය.

(9) කොමිෂන් සභාවේ තීරණය කොමිෂන් සභාවේ සාමාජිකයන් බහුතරයකගේ එකඟතාවයෙන් එළැඹි තීරණයක් වශයෙන් සැලකිය යුතු ය."

2. 14 වැනි රීතියට ඉක්බිතිවම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:

"14අ. කොමිෂන් සභාව වෙත ඔවුන්ගේ අදාළ ඉදිරිපත් කිරීම් සිදුකිරීම් සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින අභියාචකගේ සහ වගඋත්තරකරුගේ නියෝජිතයන්ගේ ඇඳුම වෘත්තීය ඇඳුම් විලාසිතාවක් හෝ විධිමත් ඇඳුම් විලාසිතාවක් විය යුතු ය.

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි අභියාචක හෝ වගඋත්තරකරු නියෝජනය කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින නීතිඥවරු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වැනි වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සකස් කර තිබෙන "1978 විනිසුරුවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ ඇඳුම් පිළිබඳ රීති" (සංශෝධිත) වල දක්වා ඇති උපදෙස් මාලාව අනුගමනය කළ යුතු ය.

EOG 09 - 0057

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.